පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - ICT

සතිය - 12 වන සතිය

පංතිය - 6ශ්‍රේණිය

සකස් කළේ - M.M.S.B මේගසූරිය

## පරිගණකයේ සුවිශේෂී ගුණාංග

දත්ත තොරතුරු බවට පත් කිරීමට මිනිසා විසින් විවිධ යන්ත්‍ර සූත්‍ර නිර්මාණය කර ඇත. එහෙත් ඒ අතර පරිගණකයට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. ඒ පරිගණකය සතු ගුණාංග රාශියක් අන්තර්ගත වන බැවිනි.

- විශාල කාලයක් ගතවන කාර්ය හෝ ගණනය කිරීම් ඉතා කෙටි කලකින් අවසන් කරගත හැකිය.
- පරිගණකය ක්‍රියාකාරිත්වයේ යම් වැරදීමක් සිදුවුවහොත් එසේ වන්නේ ලබා දී ඇති උපදෙස් වල හා සපයන ලද දත්ත වල දෝෂ හේතුවෙන් පමණි.
- මිනිසාට දැනෙන ඒකාකාරී බව, වෙහෙස හා අවධානය ගිලිහීයාම වැනි ගැටලු පරිගණකයට ඇති නොවීම.
- විශාල දත්ත හා තොරතුරු ප්‍රමාණයක් අවශ්‍ය තරම් කාලයක් තැන්පත් කර තබා අවශ්‍ය කරන අවස්ථාවකදී ක්ෂණිකව නැවත ලබාගත හැකිය.
- එක් කාර්යයක් අවසන් වූ විගස ඊට හාත්පසින්ම වෙනස් වූ කාර්යයක යෙදීමට පරිගණකයට හැකිය.
- සියලුම පරිගණක මිනිසා විසින් දෙනු ලබන විධායන් ක්‍රියාත්මක කිරීම සිදු කිරීමේ හැකියාව ඇත.

**පෙළ පොතෙහි වූ "පරිගණකයේ ලාක්ෂණික ගුණාංග" මාතෘකාව යටතේ අධ්‍යයනය කර පහත වගන්ති සඳහා තනි වචනයකින් පිළිතුරු සපයන්න.**

(a) පරිගණකයේ සිදුවන ක්‍රියාවලිය හා ප්‍රතිදානය පිළිබඳ විශ්වාසය තැබීමේ හැකියාව - ........................................

(b) පරිගණකය මිල දීගැනීමේදී මූලිකව විශාල මුදලක් වැය වුවද නඩත්තුව සඳහා අඩු මුදලක් වැය වීම - ....................................

(c) පරිගණකයට නිවැරදි දත්තයන් හා උපදෙස් ලබාදුන් විට නිවැරදි තොරතුරු ලබා ගත හැකි වීම - ......................................

(d) පරිගණකය ආශ්‍රයෙන් යම් කාර්යයක් ඉතා කෙටි කාලයකින් අවසන් කර ගැනීමේ හැකියාව - ........................................

(e) පරිගණකය භාවිතයේදී පොත් පත් විශාල ප්‍රමාණයක අඩංගු දත්ත හා තොරතුරු ගබඩා කර තබා ගැනීමේ හැකියාව -.....................................

(f) පරිගණකය මිනිසා විසින් දෙන උපදෙස් අනුවම කටයුතු කිරීමේ හැකියාව -.......................................